**වලල්ලාවිට ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ,ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.27 සිට 3.32 අතර ඡේදයන්ට අනුකූලව රු.371,925 ක් වූ ස්ථාවර තැන්පතු පොලී ආදායම් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ යටතේ දක්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව. | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ)ප්‍රමිතියේ පරිච්ඡේද අංක 6.20 ප්‍රකාරව සෑම දේපල පිරියත සහ උපකරණ සඳහා අස්ථිත්වය භාවිතා කළ ක්ෂය ක්‍රමය හා ක්ෂය අනුපාතික හෙළිදරව් කළ යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් වැඩ නිම කරන ලද රු.20,015,117 ක් වූ මංමාවත් හා බෝක්කු ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2021 වර්ෂයේ ලැබී තිබුණු රු.1,653,802 ක් වූ ප්‍රාග්ධන වියදම් ප්‍රදානවලින් අත්කර ගෙන තිබූ වත්කම් වෙනුවෙන් වාර්ෂික ක්ෂය ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් පෙර වර්ෂයේ මෙන්ම සමාලෝචිත වර්ෂයේද විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරුකිරීම් ලෙස ගැලපුම් කර නොතිබුණි. | -එම- | ප්‍රමිතියට අනුකූලව ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් තැබිය යුතුය. |
| (ඇ) 2022 වර්ෂයේ ඉටු කළ සභා කර්මාන්තයක් වෙනුවෙන් ඇස්තමේන්තු මුදල ඉක්මවා රු.161,500 ක් ගෙවීම ගිණුම්ගත කිරීමේදී වත්කම් ගිණුම හර කරනු වෙනුවට සමුච්චිත අරමුදල හර කර තිබුණි. | -එම- | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඈ) ක්ෂය ප්‍රතිපත්තියට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී මිලටගත් සහ පරිත්‍යාග ලෙස ලැබුණු රු.474,323 ක් වූ පුස්තකාල පොත් සඳහා ක්ෂය ලෙස රු.47,432 ක් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඉ) පෙර වර්ෂයේ රු.1,244,000 ක් වූ පුනරාවර්තන වියදම් ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනිත කර තිබීමේ වරද සමාලෝචිත වර්ෂයේ නිවැරදි කර තිබුණද සමාලෝචිත වර්ෂයට අදාලව ක්ෂය ලෙස රු.31,100 ක් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඊ) වර්ෂය තුල ඉවත් කරන ලද එකතුව රු.225,000 ක් වූ යන්ත්‍රවලට අදාල වාර්ෂික ක්ෂය රු.11,250 ක් ගිණුම්ගත කර නොතිබූ අතර වර්ෂය තුල ඉවත් කරන ලද එකතුව රු.41,855 ක් වූ ලී බඩුවලට අදාල සමුච්චිත ක්ෂය රු.31,392 ක් ක්ෂය වෙන් කිරීම් ගිණුමෙන් ඉවත් කර නොතිබුණි. | -එම- | -එම- |

1.7 **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුල ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු.470,301ක හිඟ ආදායම් පොත් වලින් කපාහැර තිබුණි. | පිළිතුරු ලබාදී නැත. | ප්‍රාදේශීය සභා පනතේ යොමුගත වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(2) | රු.2,952,647 ක කල් ඉකුත් වූ තැන්පතු ආදායමට ගැනීමට පෙර තැන්පතුකරුවන්ගෙන් විමසීම් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත. | යොමුගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ වියදම රු.13,572,596ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.55,306 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,973,760 | 1,974,003 | 1,576,976 | 1,082,402 | 2,557,230 | 2,783,222 | 2,194,574 | 1,649,246 |
| (ii) | කුලී | 8,279,090 | 6,696,958 | 6,127,950 | 586,618 | 8,279,090 | 3,607,430 | 3,536,074 | 330,834 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 276,500 | 408,752 | 406,752 | 2,000 | 276,500 | 351,904 | 351,904 | - |
| (iv) | වෙනත් ආදායම් | 581,000 | 941,070 | 923,130 | 17,940 | - | - | - | - |
| | | 11,110,350 | 10,020,783 | 9,034,808 | 1,688,960 | 11,112,820 | 6,742,556 | 6,082,552 | 1,980,080 |

2.2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් බදු හිඟය රු.1,495,096 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.633,384 හෙවත් සියයට 42 ක් අයකර නොතිබුණි. | රටේ පවතින අයහපත් ආර්ථික තත්වය නිසා ගෙවීම් මඟ හරින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) කුලී** | | |
| සමාලෝචිත වර්ෂය ආරම්භයට වෙළඳ ස්ථාන කුලී හිඟය රු.71,356 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.50,104 ක් හෙවත් සියයට 70 ක් අයකර නොතිබුණි. | මෙතෙක් අයකර නැති බව. | -එම- |
| **(ඇ) වෙනත් ආදායම්** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,000,000 ක් හා මුද්දර ගාස්තු රු.6,875,205 ක් විය. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | -එම- |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **හඳුනාගත් පාඩු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| සභාපතිට ලබාදී තිබූ එකතුව රු.751,884 ක් වූ පරිගණක හා උපාංග 2022 වර්ෂයේ විනාශවීම සම්බන්ධයෙන් වගකියයුත්තන් නිශ්චය කිරීම සඳහා මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ ආරම්භ කර නොතිබුණි. | පරීක්ෂණයක් සිදු කරන ලෙස 2023.05.22 දින සහ 2024.04.01 දින පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති බව. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අලාභය අය කර ගත යුතුය. |

3.2 **වත්කම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාව සතු කැබ් රථයක් , ජේසීබී යන්ත්‍රයක් හා ට්‍රැක්ටර් රථයක් වර්ෂ 02 ක සිටද, තවත් ට්‍රැක්ටර් රථ 02 ක් වර්ෂ 09 ක කාලයක සිට | අලුත්වැඩියා කිරීමට ඇස්තමේන්තු ලැබී තිබුණද, | අළුත්වැඩියා කටයුතු කඩිනම් කර වත්කම් භාවිතයට ගත යුතුය. |

| | | |
|---|---|---|
| ද අළුත්වැඩියා කිරීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි. | සභාව සතුව ප්‍රතිපාදන නොමැති බව . | |
| (ආ) 2015 වර්ෂයේදී සභාවට ලද රු.1,600,000 ක් වටිනා කම්පැක්ටරය එම වර්ෂයේ සිටම භාවිතයට ගෙන නොතිබුණි. | වෙනත් ආයතනයකට ලබා දීමට අපේක්ෂිත බව. | වත්කම් කළමනාකරණය විධිමත් කළ යුතුය. |